GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

**2014.07.30**

## මාධ්‍ය නිවේදනයයි.

අද දින (2014.07.30) ශ්‍රී ලංකා ජාතික රෝහලේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපතියැයි කියා ගන්නා විශේෂඥ වෛද්‍යවරයෙක් මඟින් රැස්වීමක් සංවිධානය කර තිබිණි. නමුත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සම්බන්ධව දැනට පවතින අර්බුධකාරී තත්ත්වය හමුවේ ජාතික රෝහල වැනි වැදගත් ස්ථානයක සංකුලතා ඇති කිරීමේ අරමුණින් යොදා ගෙන තිබූ මෙම ඊනියා රැස්වීම පිළිබඳ බහුතරයක්, ජාතික රෝහල් වෛද්‍යවරුද රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ කමිටු සාමාජිකයන්ද පැමිණ දැඩි විරෝධයක් දැක්වීමෙන් අනතුරුව එම රැස්වීම පැවැත්වීම වලක්වන ලදී.

එහිදී රැස්වූ ජාතික රෝහලේ වෛද්‍යවරු ඇතුළු අනෙකුත් සාමාජිකයන් දැනට ජාතික රෝහලේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ කටයුතු භාරව සිටින භාරකාර මණ්ඩලය මඟින් තවදුරටත් සිදුවිය යුතු බව තීරණය කරන ලදී.

ඉන්පසු ජාතික රෝහල් රැස්වීම් භූමියෙන් එලවා දැමූ වෛද්‍යවරුන් කිහිපදෙනා වෙනත් ස්ථානයක තවත් රැස්වීමක් රහසිගතව පැවැත්වීමට කටයුතු යොදා ඇති බව දැනගන්නට ලැබී ඇත. ඔවුන් උත්සාහ දරන්නේ කොළඹ ජාතික රෝහලේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ රැස්වීම හුවා දක්වමින් එයට මාධ්‍ය ප්‍රචාරයක් ලබා දීමයි.

ස්තුතියි,

වෛද්‍ය චන්දික එපිටකඩුව
මාධ්‍ය අනු කමිටුව,

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර - | වෛද්‍ය චන්දික එපිටකඩුව | 0718609961 |
| | වෛද්‍ය ප්‍රසාද් රණවීර | 0773527476 |
| | වෛද්‍ය විපුල ඉන්ද්‍රලාල් | 0717368142 |
| | වෛද්‍ය හරිත අලුත්ගේ | 0718121619 |
| | වෛද්‍ය අමිල මදුරාගොඩ | 0773553186 |